උඩුබද්දාව ප්‍රාදේශීය සභාව - 2024
---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

උඩුබද්දාව ප්‍රාදේශීය සභාවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උප වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10(1) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2024 දෙසැම්බර් 31 දිනට උඩුබද්දාව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන්, ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේ දී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව, විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී, වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති වීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟ හැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වා ගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත්සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිති,රීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳව වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.6.1 පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූල නොවීම

අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට සභාව විසින් නඩු 07 ක් පවත්වාගෙන යන අතර, මූල්‍ය ප්‍රකාශනවල ඒ නඩු පිළිබඳව හෙළිදරව් කර නොතිබුණි. එම නඩු වෙනුවෙන් 2024 දෙසැම්බර් 31 දින වන විට නඩු ගාස්තු ලෙස සහා අරමුදලින් රු.149,500 ක් ගෙවා තිබුණි.	අතපසු විමකින් හෙළිදරව් කර නොමැති අතර 2025 වර්ෂයේ සිට අදාල සටහන් යෙදීමට කටයුතු කරන බව	මූල්‍ය ප්‍රකාශනවල නඩු පිළිබඳව හෙළිදරව් කල යුතුය.

1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	තක්සේරු වටිනාකම රු.4,092,000 ක් වූ ඉඩම් 02 ක සහ සුසාන භූමි 04 ක වටිනාකම ගිණුම් ගත කර නොතිබුණි.	2025 වර්ෂයේ ගැලපීමට කටයුතු කරන බව.	සියලුම වත්කම් නිවැරදිව ගිණුම්ගත කිරීම කළ යුතුය.
(ආ)	වටිනාකම රු.217,000 ක් වූ යගම්වෙල උප කාර්යාලයේ කම්බි වැටෙහි වටිනාකම, රු.225,000 ක් වූ කොල්ලුපිටිය වත්ත ප්‍රාදේශීය සභාව සතු ඉඩම කැබලි 03 හි කම්බි වැටෙහි වටිනාකම සහ රු.480,000 ක් වූ දුම්මලසූරිය පෙර පාසලේ මිදුලෙහි කුට්ටිගල් ඇතිරීමේ වටිනාකම ප්‍රාග්ධනිත කර නොතිබුණි.	2025 වර්ෂයේ ගැලපීමට කටයුතු කරන බව.	සියලුම ප්‍රාග්ධන වියදම් ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය.
(ඇ)	පලාත් නිශ්චිත ප්‍රදාන යටතේ සන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයේ නොදිරන ද්‍රව්‍ය ගබඩා කිරීමේ ගොඩනැගිල්ල පුළුල් කිරීම සඳහා දරන ලද රු.1,000,000 වියදම ප්‍රාග්ධනිත කර නොතිබුණි.	2025 වර්ෂයේ ගැලපීමට කටයුතු කරන බව.	ප්‍රාග්ධන වියදම් නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය.

1.7 අනුකූල නොවීම

1.7.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

	නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව	අනුකූල නොවීම	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත			
	134 වගන්තිය	දියුණු කල ගම් ප්‍රදේශ හඳුනාගෙන ප්‍රකාශයට පත් කිරීමට කටයුතු කර නොතිබුණි.	දියුණු කල ගම් ප්‍රදේශ හඳුනාගෙන ප්‍රකාශයට පත් කිරීම 2015 වර්ෂයේ දී සිදු කර ඇති බවත් ජනතාව විසින් ආයතනයට විරුද්ධව මේ වන විට නඩුවක් පවරා ඇති බවත් ඒ හේතුවෙන් වරිපනම් අයකර ගැනීමේදී හිඟයක් පවතින බව.	දියුණු කල ගම් ප්‍රදේශ හඳුනාගෙන ප්‍රකාශයට පත් කිරීමට කටයුතු කර ජනතාවට සේවයක් සැපයීමට ක්‍රියා කල යුතුය.
(ආ)	2018 අංක 19 දරණ ජාතික විගණන පනත VII වන පරිච්ඡේදයේ 38(2) වගන්තිය	මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් පවත්වාගෙන යනු ලබන බවටත් එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳ කලින් කළ සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කර ඇති බවටත් ප්‍රධාන ගණන් දීමේ නිලධාරී විසින් ඉටුකළ යුතු ලිඛිත සමාලෝචනයේ පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කරන විට ඉටු කලයුතු සමාලෝචනයේ ලිඛිත පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට පියවර ගන්නා බව.	මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් පවත්වාගෙන යා යුතුය.
(ඇ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය			
	මුදල් රෙගුලාසි 571 (2)	වසර 05 කට වැඩි රු.4,523,496 ක් වූ තැන්පතු 03 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව නියාදනය කිරීමට කටයුතු කර නොතිබුණි.	ඉදිරියේදී නිරවුල් කිරීමට කටයුතු කරන බව.	කල් ඉකුත් වූ තැන්පතු මුදල් රෙගුලාසි අනුව නියාදනය කිරීමට කටයුතු කළ යුතුය.

(ඈ) ප්‍රාදේශීය සභා මූල්‍ය හා පරිපාලන රීති

218 රීතිය	පත් කල මණ්ඩලයක් විසින් වාර්ෂික ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳ වාර්ෂික සමීක්ෂණයක් සිදු කල යුතු වුවත් එසේ සිදු කර නොතිබුණි.	විගණනය විසින් පෙන්වා දුන් පරිදි මේ වන විට සමීක්ෂණ මණ්ඩලයක් පත්කර සමීක්ෂණයක් සිදුකර ඇති බව.	රීති ප්‍රකාරව වාර්ෂික ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳ සමීක්ෂණයක් සිදු කල යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.19,541,885 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.27,529,105 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

		2024 වර්ෂය				2023 වර්ෂය			
	ආදායම් ප්‍රභවය	ඇස්තමේන්තු ගත ආදායම්	බිල් කළ ආදායම්	රැස්කළ ආදායම්	දෙසැම්බර් 31 දිනට මුළු හිඟය	ඇස්තමේන්තු ගත ආදායම්	බිල් කළ ආදායම්	රැස්කළ ආදායම්	දෙසැම්බර් 31 දිනට මුළු හිඟය
		රු.000	රු.000	රු.000	රු.000	රු.000	රු.000	රු.000	රු.000
(i)	වරිපනම් හා බදු	4,918	4,456	4,168	4,234	4,810	4,203	3,770	3,945
(ii)	කුලී	15,274	15,824	15,889	339	14,088	9,615	15,024	404
(iii)	බලපත්‍ර ගාස්තු	1,463	1,165	1,165	-	1,391	860	860	-
(iv)	වෙනත් ආදායම්	93,635	75,119	99,084	65,145	93,404	16,197	86,925	89,110
	එකතුව	115,290	96,564	120,306	69,718	113,693	30,875	106,579	93,459

2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේ ආරම්භක දිනට වූ රුපියල් මිලියන 93 ක් වූ හිඟ ආදායමෙන් හා මිලියන 96 ක් වූ වර්ෂයේ බිල් කිරීම්වල එකතුවෙන් රුපියල් මිලියන 120 ක් අයකර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට රුපියල් මිලියන 69 ක් තවදුරටත් හිඟහිටව පැවතුණි.	2025 වර්ෂයේ සිට හිඟ ආදායම් අයකර ගැනීම සඳහා වැඩසටහන් සිදුකිරීමට සැලසුම් කර ඇති බව.	හිඟ ආදායම් අප්‍රමාදීව අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ආ)	**වරිපනම් හා බදු**		
(i)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති රු.4,158,900 ක වරිපනම් බදු ශේෂය තුල වසර 1 ත් 5 ත් අතර කාලයට අදාලව රු.1,869,034 ක් සහ වසර 05 ට වැඩි රු.2,262,866 ක් අය නොවී පැවතුණි. එම හිඟ ශේෂ අයකර ගැනීමට කළමනාකරණය කටයුතු කර නොතිබුණි.	ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරන බව.	හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ii)	සමාලෝචිත වර්ෂයට අදාලව වරිපනම් බිල් කිරීම රු.4,419,189 ක් වූ අතර ඉන් රු.1,348,099 ක් එනම් සියයට 31 ක් ම හිඟව පැවතුණි.	2025 මාර්තු 31 දින වන විට එම හිඟය සියයට 71 ක ප්‍රමාණයක් දක්වා හිඟ අයකර ගැනීමට හැකි වූ බව.	බිල්කළ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ඇ)	**වෙනත් ආදායම්**		
	පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු උසාවි දඩ රු.11,956,820 ක් හා මුද්දර ගාස්තු රු.50,426,689 ක් අයකරගෙන නොතිබුණි.	ලැබිය යුතුව තිබුණු උසාවි දඩ මුදලෙන් 2025 මාර්තු 31 දිනට රු.10,656,820 ක් අයකරගෙන ඇති බවත් මුද්දර ගාස්තු රු.11,291,550 ක් අය කරගෙන ඇති බව.	උසාවි දඩ හා මුද්දර ගාස්තු ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතුය.

3. මෙහෙයුම් සමාලෝචනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය හැකිව තිබුණු නමුත් 2024 දෙසැම්බර් 31 දින වන විටත් අතුරු ව්‍යවස්ථා සකස් කර සම්මත කර ගෙන නොතිබුණු අතර වැළඳගෙන තිබුණු අතුරු ව්‍යවස්ථා ක්‍රියාත්මක මට්ටමේ නොපැවතුණි.	2021.12.17 දින බල ප්‍රදේශයේ මාළු වෙළඳාම විධිමත් කිරීම සඳහා සකස් කළ අතුරු ව්‍යවස්ථාව අනුමැතියට යවා ඇතත් තවම පිළිතුරක් ලැබී නොමැති බව.	අතුරු ව්‍යවස්ථා පනවා සභාවේ කටයුතු විධිමත් කිරීමට ක්‍රියා කළ යුතුය.

3.2 කළමනාකරණ අකායර්ක්ෂමතා

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සභාව සතු බැකෝ ලෝඩරයේ 2024 ජුනි 03 දින පැති වීදුරුවක් බිඳී යාම සම්බන්ධව මුදල් රෙගුලාසි ප්‍රකාරව පරීක්ෂණ සිදුකර වගකිවයුත්තන් නිශ්චය කර නොතිබුණු අතර, පැති වීදුරුව අලුතින් යෙදීම සඳහා රු.133,990 ක ඇස්තමේන්තුවක් ලබාදී තිබුණි. එම මුදලින් රු.115,343 ක් රක්ෂණ නියෝජන ආයතනය විසින් ප්‍රතිපූර්ණය කර තිබුණු අතර රු.18,647ක් කමිටු තීරණයක් මත සහා අරමුදලින් දරා තිබුණි.	මුදල් රෙගුලාසි ප්‍රකාරව පරීක්ෂණ සිදුකර වගකිව යුත්තන් නිශ්චය කර නොතිබුණු අතර, පැති වීදුරුව අළුතින් යෙදීම සඳහා රු.115,343 ක් රක්ෂණ නියෝජිත ආයතනය විසින් ද, රු.18,647 ක් කමිටු තීරණයක් මත සහා අරමුදලින්ද දරන ලද බව.	රක්ෂණය මඟින් හානි ප්‍රතිපූර්ණය කළද මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර වගකිව යුත්තන් නිශ්චය කළ යුතුය.
(ආ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ 12 ක එකතු වටිනාකම රු.71,111,924 ක් විය. ඒ පිළිබඳ කාල විශ්ලේෂණයට අනුව වසර 1 සිට 5 දක්වා කාලයට අදාළ ගිණුම් ශේෂ එකතුව රු.68,759,453 ක් වූ අතර වසර 05 ක කාලය ඉක්මවා තිබූ ගිණුම් ශේෂ එකතුව රු.2,325,892 ක් වී තිබුණි. මෙම මුදල් අයකර ගැනීම කෙරෙහි කළමණාකරණයේ අවධානය යොමුකර නොතිබුණි.	ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරන බව.	ලැබිය යුතු ශේෂය අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ඇ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂ 15 ක එකතු වටිනාකම රු.41,615,640 ක් විය. ඒ පිළිබඳ කාල විශ්ලේෂණයට අනුව වසර 1 සිට 5 දක්වා කාලයට අදාළ ගිණුම් ශේෂ එකතුව රු.36,879,643 ක් වූ අතර වසර 05 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂ එකතුව රු. 4,735,996 ක් වී තිබුණි. මෙම ශේෂයන්ගේ පැවැත්ම පිළිබඳව සොයා බලා නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.	ඉදිරියේදී නිරවුල් කිරීමට කටයුතු කරන බව.	ගෙවිය යුතු ශේෂවල පැවැත්ම පිළිබඳව සොයා බලා නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය.
(ඈ)	2021 වර්ෂයේ ස්ථාපිත කරන ලද සභාව විසින් පරිහරණය කරන CAT මෘදුකාංග පද්ධතිය සභාවේ සියළු කටයුතු ආවරණය වන පරිදි භාවිතා කළ නොහැකි වීමත්, සභාවේ කටයුතු සම්බන්ධයෙන් අවශ්‍ය වාර්තා ලබා ගැනීමට නොහැකි වීමත් යන අඩුපාඩු නිරීක්ෂණය වූ අතර විගණිත අවස්ථාව දක්වා එම අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.	ඉදිරියේදී යාවත්කාලීන කරන බව.	අඩුපාඩු නිවැරදි කර ඵලදායීව යොදා ගැනීමට කටයුතු කළ යුතුය.

(ඉ)	ලැබී තිබුණු පරිසර පැමිණිලිවලට අදාළව ක්ෂේත්‍ර පරීක්ෂාවලදී ලබා දුන් නිර්දේශ හා පරිසර කමිටු නිර්දේශ නිසි පරිදි ක්‍රියාත්මක කෙරේද යන්න පරීක්ෂා කර තහවුරු කර ගැනීම සඳහා විධිමත් ක්‍රමවේදයක් සකස් කර ක්‍රියාත්මක කර නොතිබුණි.	ඉදිරියේදී පරිසර පැමිණිලි පරීක්ෂා කර තහවුරු කරගැනීම සඳහා විධිමත් ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීමට සැලැසුම් කර ඇති බව.	විධිමත් ක්‍රමවේදයක් සකස් කර ක්‍රියාත්මක කළ යුතුය.

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
වයඹ පළාත් සභාව විසින් 2013 අංක 01 දරන ප්‍රඥප්තිය මඟින් ප්‍රජා මූල සංවිධාන ලියාපදිංචි කරවීම හා අධීක්ෂණය එම ප්‍රදේශයේ පළාත් පාලන ආයතනයට පවරා දී තිබුණු නමුත් සභාව විසින් එම කාර්යය ඉටුකර නොතිබුණු අතර සභා බල ප්‍රදේශය තුළ ස්ථාපිත ප්‍රජා මූල සංවිධාන සියල්ල විධිමත් පරිදි සභාව විසින් හඳුනාගෙන නොතිබුණි.	අදහස් දක්වා නොමැත.	සභා බල ප්‍රදේශය තුළ ස්ථාපිත ප්‍රජා මූල සංවිධාන නියාමනය කර එහි කටයුතු විධිමත් කිරීමට කටයුතු කළ යුතුය.

3.4 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
සභාව සතුව පවතින ගිලන් රථය අලුත්වැඩියා කටයුතු සිදු නොකර වසර 03 කට අධික කාලයක් නිශ්ක්‍රීයව ගාල්කර තබා තිබුණි.	වෙනත් ආයතනයකට අනුයුක්ත කිරීමට කටයුතු කරන බව.	අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට හෝ අපහරණය කිරීමට ක්‍රියා කළ යුතුය.

3.5 වත්කම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	වත්කම්වල අගයන් කාලීනව ප්‍රත්‍යාගණනය කිරීමේදී සියලුම වත්කම් ප්‍රත්‍යාගණනය නොකිරීම හේතුවෙන් රු.50, රු.100 වැනි නාමික වටිනාකමින් යුක්ත වත්කම් ලේඛනවල පැවතුණි.	පාරවල් සහ ළිං ප්‍රත්‍යාගණනය කිරීම සඳහා අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කරන බව.	වත්කම්වල සාධාරණ අගය ගිණුම්වලින් හෙළිදරව් කළ යුතුය.
(ආ)	ලී බඩු උපකරණ සඳහා වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණ අතර ඉඩම් හා ගොඩනැගිලි යන වත්කම් වෙන් වෙන්ව හඳුනාගෙන නොතිබුණි.	ලේඛනවල අඩුපාඩු ඇතිනම් නිවැරදි කිරීමට කටයුතු සිදු කරන බව.	වත්කම් ලේඛන නිවැරදිව යාවත්කාලීනව පවත්වාගෙන යාමට කටයුතු කළ යුතුය.
(ඇ)	සභාව විසින් නඩත්තු කරන ක්‍රීඩා පිටි 05 ක් හා සුසාන භූමි 31 ක් විගණිත දින වන විටත් සභාව වෙත පවරාගෙන නොතිබුණි.	අදාල ක්‍රියාවලිය සිදුකරමින් පවතින බව.	පවරා නොගත් වත්කම් පවරා ගැනීමට කිරීමට කටයුතු කළ යුතුය.

(ඇ)	සභාව විසින් භාවිත කරන නමුත් වෙනත් රජයේ ආයතන නමින් ලියාපදිංචි වාහන 02ක අයිතිය විගණිත දින වන විටත් සභාව වෙත පවරා ගෙන නොතිබුණි.	පවරා ගැනීමට කටයුතු සිදුකරන බව.	වාහනවල අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතුය.

3.6 ප්‍රසම්පාදන කළමනාකරණය

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
සභාව විසින් මිලදී ගන්නා භාණ්ඩයන් හෝ ද්‍රව්‍යයන් සඳහා ප්‍රසම්පාදන ගොනු පවත්වා නොතිබීම, වටිනාකමින් වැඩි ප්‍රසම්පාදන සඳහා මිලදී ගැනීමේ ඉල්ලීම, එකී ඉල්ලීම සඳහා අනුමැතිය , මිල ගණන් කැඳවීමේ පුවත්පත් දැන්වීමේ ලංසුකරුවන් ඉදිරිපත් කරන ලද මිල ගණන්, ප්‍රසම්පාදන තීරණය, තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශය, ද්‍රව්‍ය ඇනවුම යනාදිය ඇතුළත්ව ගොනු පවත්වා නොතිබුණි.	ඉදිරියේදී ගොනු පවත්වා ගෙන යන බව.	ප්‍රසම්පාදන ක්‍රියාවලිය විනිවිද භාවයකින් යුතුව සිදු කිරීම සඳහා ගොනු පවත්වාගෙන යා යුතුය.

3.7 මානව සම්පත් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
2024 දෙසැම්බර් 31 දිනට සේවකයින් දෙදෙනෙකුට අදාලව රු.304,460 ක ණය ශේෂයක් අය නොවී පැවතුණි. මෙම ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	වාරික වශයෙන් ගෙවීම් සිදුකරන බවත් විශ්‍රාම පාරිතෝෂිකය ලැබුණු පසු අයකර ගැනීමටත් කටයුතු කරන බව.	ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

4.1 අයවැය පාලනය

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
නිසි පුරෝකථනයකින් තොරව අයවැය ඇස්තමේන්තු සකස් කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ආදායම් විෂයයන් 08 ක අයවැයගත ආදායම් හා තථ්‍ය ආදායම් අතර සියයට 02 සිට සියයට 52 දක්වා වූ පරාසයක විචලතාවයක්ද වියදම් විෂයයන් 05 ක සියයට 10 සිට සියයට 33 ක් දක්වා වූ පරාසයක විචලතාවයක්ද නිරීක්ෂණය විය.	ඉදිරියේදී විචලනයන් සිදු නොවන ආකාරයට අයවැය සකස් කිරීමට කටයුතු කරන බව.	අයවැය ලේඛනය ආයතනයේ කළමනාකරණයට සහාය වන පාලන කාරකයක් ලෙස භාවිතා කිරීමට හැකිවන පරිදි සකස් කළ යුතුය.

4.2 තිරසාර සංවධර්න අරමුණු

විගණන නිරීක්ෂණය	**සභාවේ අදහස් දැක්වීම**	නිර්දේශය
තිරසර සංවර්ධන අරමුණු ලගා කර ගැනීම සදහා සමාලෝචිත වර්ෂය තුල ඉටු කිරීමට සැලසුම් කර තිබුණු ඉලක්ක 02 කට අදාල ප්‍රගතිය සියයට 50 ට වඩා අඩු මට්ටමක පැවති අතර ඉලක්ක 02 ක ප්‍රගතිය වාර්තා කර නොතිබුණි.	අයහපත් මූල්‍ය තත්වය මත නියමිත ඉලක්කයන් ලගා කර ගැනීමට නොහැකි වූ බව.	තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක ළඟා කර ගැනීමට ක්‍රියා කළ යුතුය.